Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**ADIC මාධ්‍ය නිවේදනය**
**2026.01.07**

**ශ්‍රී ලංකාවේ දුම්කොළ පාලන උත්සාහයන් කෙරෙහි දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම්හි බලපෑම්: ගෝලීය සහ ශ්‍රී ලාංකික දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් (TII) දර්ශකය එළි දැක්වීම.**

දුම්කොළ පාලනය සඳහා ශ්‍රී ලංකාවේ දිගුකාලීන කැපවීමක් තිබුණ ද, දුම්කොළ භාවිතය තවමත් බරපතල හා අඛණ්ඩ මහජන සෞඛ්‍ය අභියෝගයක් ලෙස පවතී. ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් මිලියන 1.5 ක් පමණ දුම්පානය කරන අතර, දිනකට දුම්කොළ ආශ්‍රිත මරණ 50 කට ආසන්න සංඛ්‍යාවකට එය හේතු වේ. මීට අමතරව, රටේ සිදුවන සියලුම මරණ වලින් 83% ක් බෝ නොවන රෝග (NCD) හේතුවෙන් සිදුවන අතර, දුම්කොළ භාවිතය එහි ප්‍රධාන අවධානම් සාධක හතරෙන් එකක් වේ. මෙය ජාතික සෞඛ්‍ය සේවා පද්ධතියට සැලකිය යුතු බරක් එක් කරයි. ශ්‍රී ලාංකිකයන් දිනකට සිගරට් සඳහා ඇස්තමේන්තුගත රුපියල් මිලියන 520 ක් වැය කරන අතර එමඟින් පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන්හි පවතින මූල්‍ය දුෂ්කරතා උග්‍ර කරයි. මෙම අභියෝග මධ්‍යයේ, දුම්කොළ කර්මාන්තය තම වෙළඳපල පැවැත්ම පවත්වා ගැනීමට සහ ඔවුන්ගේ අඩු වෙමින් පවතින පාරිභෝගික පදනම ප්‍රතිස්ථාපනය කිරීමට කූට, සදාචාර විරෝධී සහ නිරන්තරයෙන් වෙනස් වන උපාය මාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් විශේෂයෙන් තරුණයින්, ළමුන්, දුම්පානය නොකරන්නන් සහ අනෙකුත් අවධානමට ලක්විය හැකි ජනගහනය ඉලක්ක කර ගනිමින් මහජන සෞඛ්‍ය ඉලක්ක සෘජුවම අඩපණ කරයි.

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC), දුම්කොළ පාලනය පිළිබඳ යහපාලනය සඳහා වූ ගෝලීය මධ්‍යස්ථානය (GGTC) සමඟ එක්ව, ගෝලීය සහ ශ්‍රී ලාංකික දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් (TII) දර්ශකය එළි දැක්වූ අතර, එමඟින් දුම්කොළ කර්මාන්ත උපාය මාර්ග ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති සහ දුම්කොළ පාලන ප්‍රයත්නවලට අඛණ්ඩව බලපාන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දී ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවේ (FCTC) රාජ්‍ය පාර්ශවයන්, 5.3 වගන්තිය සහ එහි ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ භාවිතා කිරීමෙන් ඔවුන්ගේ සෞඛ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර, එමඟින් වාණිජ හා අනෙකුත් නිත්‍ය අවශ්‍යතාවලින් මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට බලය ලබා දේ. 2019 දී දියත් කරන ලද මුලපිරීමක් වන TII දර්ශකය, රජයන් විසින් WHO FCTC හි 5.3 වගන්තිය යටතේ දක්වා ඇති පියවර ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සිවිල් සමාජ සමාලෝචනයක් වන අතර එය ආරම්භයේ සිට සෑම වසර දෙකකට වරක් පවත්වනු ලැබේ. 2025 ගෝලීය TII දර්ශකය නැගෙනහිර මධ්‍යධරණී කලාපය, ඇමරිකාව, යුරෝපය, දකුණු සහ අග්නිදිග ආසියාව සහ බටහිර පැසිෆික් කලාපයේ රටවල් 100 ක් සමීක්ෂණය කරන ලද අතර, 2023 අප්‍රේල් 1 සිට 2025 මාර්තු 31 දක්වා කාලය තුළ දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ මෙම මැදිහත්වීම්වලට අදාළ රජයන්ගේ ප්‍රතිචාර පිළිබඳ විවෘතව ලබා ගත හැකි තොරතුරු මත පදනම් වේ.

2025 ගෝලීය TII දර්ශකයට අනුව, ශ්‍රී ලංකාව 45 වන ස්ථානයේ පසු වේ. එය 40-49 ලකුණු පරාසය තුළට අයත් වන අතර, මෙම දර්ශකයේ අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීම රටක් දුම්කොළ කර්මාන්තයේ මැදිහත් වීම් අඩු මට්ටමක් පිළිබිඹු කරන අතර එය සාධනීය ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ සමස්ත ලකුණු 2023 වසරට සාපේක්ෂව ලකුණු තුනකින් පිරිහී ඇති අතර, එය දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම්වල වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම පිරිහීම ප්‍රධාන වශයෙන් ගෝලීය දර්ශකය යටතේ හඳුනාගෙන ඇති පහත සඳහන් සාධක බලපා ඇත.

- බැඳියාවන් අතර ගැටුම: රජයේ නිලධාරීන් සහ දුම්කොළ කර්මාන්ත අතර සම්බන්ධතා

-ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් සහ ඥාතීන් දුම්කොළ කර්මාන්තයේ මණ්ඩල සහ උපදේශක තනතුරු ඇතුළු භූමිකාවන් දරති.

-ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් දුම්කොළ සමාගම්වල නායකත්ව භූමිකාවන් දරමින් සිටින හෝ දරා ඇති අතර, එමඟින් බැඳියාවන් අතර ගැටුම්වලට අදාළ බරපතල ගැටළු මතු වේ.

- ආයතනික සමාජ වගකීම (CSR) මුවාවෙන් දුම්කොළ කර්මාන්තයේ සදාචාර විරෝධී ප්‍රතිරූපය යටපත් කරගනිමින් ඔවුන් සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් පෙනී සිටින බව පෙන්වීමට යොදාගන්නා විවිධ උපක්‍රම වලට රජය මැදිහත් කරගැනීම.

දුම්කොළ කර්මාන්තයේ අඛණ්ඩ මැදිහත්වීම් හේතුවෙන්, පහත සඳහන් යෝජිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇති අතර, මෙම ප්‍රමුඛතා බහුතරය 2019 සිට තවමත් ක්‍රියාත්මක වී නොමැත. මෙය, ජාතික දුම්කොළ පාලන උත්සාහයන් අඩපණ කරමින් සහ වසර ගණනාවක් පුරා වෙහෙස මහන්සි වී දිනාගත් මහජන සෞඛ්‍ය ජයග්‍රහණ බරපතල අවදානමකට ලක් කරයි.

•රජය විසින් දුම්කොළ නිෂ්පාදන බදු නිවැරදිව එකතු කිරීම සහතික කිරීම සඳහා විද්‍යාත්මක බදු ක්‍රමයක් ස්ථාපනය කිරීම.

•එක දෙක වශයෙන් අලෙවි වන සිගරට් අලෙවිය තහනම් කිරීම.

•අධ්‍යාපන ආයතනයක හෝ ආගමික ස්ථානයක සිට මීටර් 100ක් ඇතුළත දුම්කොළ සිල්ලර වෙළඳසැල් පවත්වාගෙන යාම තහනම් කිරීම.

•දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී (NATA) පනත යටතේ ඇති වැරදි, අත් අඩංගුවට ගත හැකි වැරදි බවට බලාත්මක කිරීම.

• NATA පනතට අදාළ වැරදි සඳහා දඩ මුදල සහ දඬුවම් වැඩි කිරීම.

• දුම්කොළ වගාව අධෛර්යමත් කිරීම සහ දුම්කොළ ගොවීන් වෙනත් බෝග වගාවන් වෙත යොමු කිරීම.

• දුම්කොළ කර්මාන්තයේ වෙළඳ සලකුණු වලින් තොර (Plain Packaging) ඇසුරුම්කරණය ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාව වසර ගණනාවක් පුරා දුම්කොළ පාලනය සඳහා දැඩි දේශපාලන කැපවීමක් පෙන්නුම් කර ඇත. 2003 දී WHO FCTC සම්මත කළ අග්නිදිග ආසියානු කලාපයේ පළමු රට වීමත් සමඟ, ශ්‍රී ලංකාව වැදගත් දුම්කොළ පාලන ප්‍රතිපත්ති කිහිපයක් ස්ථාපිත කරන ලදී. මීට අමතරව, 2006 දී NATA පනත බලාත්මක කිරීම මඟින් වයස අවුරුදු 21 ට අඩු පුද්ගලයින්ට දුම්කොළ අලෙවිය තහනම් කිරීම, දුම්කොළ ඇසුරුම් සඳහා අනිවාර්ය සෞඛ්‍ය අනතුරු ඇඟවීම් ඇතුළත් කිරීම, සිගරට් සඳහා බදු වැඩි කිරීම, ජනමාධ්‍ය ප්‍රචාරණය සීමා කිරීම සහ පොදු ස්ථානවල දුම්පානය තහනම් කිරීම ඇතුළු සැලකිය යුතු දුම්කොළ පාලන පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. FCTC හි 11 වන වගන්තියට අනුකූලව, 2015 දී සිගරට් ඇසුරුම් සඳහා 80% ක රූපමය සෞඛ්‍ය අනතුරු ඇඟවීම් ක්‍රියාත්මක කරන ලදී.

එහෙත්, අඛණ්ඩ කර්මාන්ත මැදිහත්වීම් හේතුවෙන් ස්ථාපිත ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම ද අභියෝගයක් ලෙස පවතී. TII දර්ශකයේ සොයාගැනීම් මඟින් ශක්තිමත් ආරක්ෂණ ක්‍රම, 5.3 වගන්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය නිත්‍ය අවශ්‍යතාවයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා වැඩි විනිවිධ බාවයක් අවශ්‍ය බව තවදුරටත් ඉස්මතු කරයි.

දුම්කොළ ආශ්‍රිත හානිවලින් අනාගත පරම්පරාවන් ආරක්ෂා කිරීම සඳහා දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් වලින් දැඩි ලෙස ආරක්ෂා වන තීරණාත්මක, විනිවිධ පෙනෙන ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. ඒ අනුව, වාණිජ අරමුණු මත ක්‍රියාත්මක වන උපක්‍රම වලට හසු නොවී මහජන සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසත්, තවදුරටත් ප්‍රමාදයකින් තොරව තීරණාත්මක දුම්කොළ පාලන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කඩිනම් කරන ලෙසත්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන් සහ මහජන සෞඛ්‍ය ප්‍රයත්නයන් තුළ දුම්කොළ කර්මාන්තයේ සියලු ආකාරයේ මැදිහත්වීම් සක්‍රීයව හඳුනා ගැනීම, අභියෝග කිරීම සහ වැළැක්වීම සඳහා සුපරීක්ෂාකාරීව සිටින ලෙසත් ADIC ආයතනය, ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සහ සියලුම අදාළ පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටී.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය**